# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,653 — 1966 පෙබරවාරි 3 වැනි බ්‍රහස්පතින්ද — 1966.2.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... | 43 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 43 | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — | | |


සැළකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරි බලයෙන්, අග්‍රවිනිශ්චයකාර ධූරන්ධර මිලියානි ක්ලෝඩ් සන්සෝනි වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා, එයට සෑහෙන කරුණු පෙනී, 1966 පළමුවැනි නැගෙනහිර වාරිකාව සඳහා මඩකලපුවේ දී පැවැත්වීමට නියමිත ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාරය වෙනුවට 1966 පෙබරවාරි මස 21 වැනි සඳු දින සිට තිරිකුණාමලයේ අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

1966 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දීය.

ඇම්. සී. සන්සෝනි,
අග්‍රවිනිශ්චයකාර.

1–54

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### මධ්‍යම පළාත

#### සියඹලාගොඩ ගම්බද උසාවියේ දීය

ගහවට ගම්සභාවේ, ආදායම් ඕවර්සියර්.................පැමිණිලිකාරයා.

එදිරිව

නොම්මර ක්‍රි.—8776, 8777, 8778, 8779, 8780, 8781, 8782, 8783, 8784, 8785, 8786, 8787, 8788, 8789, 8790, 8791, 8792, 8793, 8794 සහ 8795.

මුල්ගම්පොල බෝගොඩවත්තේ අඩක 166 පදිංචි ජී. කේ. ජී. අප්පුහාමි ............................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වෂී 1966 ක්.වූ මාර්තු මස 1 දින උදේ 11 පැයට එකී ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් එක් දහස් එකසිය හතලිස් නවයයි ශත හැටක් (රු. 1,149.60) සහ අනිකුත් වියදම් අයකර ගැනීම සඳහා ය.

එනම් :—මහනුවර ගහවට ගම්සභා සීමාව තුළ බෝගොඩවත්ත කොටසේ අක්කර $10\frac{1}{2}$ක් පමණ වූ හෙට්ටියාවත්ත නමැති ඉඩමේ පහත සඳහන් මායිම් තුළ පිහිටි වරිපනම් අංක 61/17 දරණ විත්තිකරුට අයත් උළු සෙවිලි කරන ලද ගෙය වේ.

ඉඩමට මායිම් : උතුරට මැද ඇළ සහ ඇම්. සිරිසේන, පී. ඇම්. කේ. පෙරේරා සහ තවත් අයට අයිති කොට කුඹුර නමැති ඉඩම ; දකුණට : පී. ආර්. ටයිලර්, ඇම්. බී. රත්නායක සහ තවත් අයට අයිති ඉඩම ; නැගෙනහිරට : ඇම්. වික්‍රමසිංහ, සී. වික්‍රමසිංහ, ඇම්. බී. සේනානායක, එච්. ඇම්. ධම්මවඩීන සහ ජී. ඇම්. කේ. බණ්ඩා යන අයවලුන්ට අයත් ඉඩම් ; බස්නාහිරට : පී. ආර්. ඇම්. කළු බණ්ඩා, බී. ආර්. පොන්වීර සහ ඒ. එච්. ඒ. ඩයස් යන අයවලුන්ට අයත් ඉඩම්.

1966 ජනවාරි මස 15 වැනි දින,
මහනුවර පිස්කල් කායසීලයේ දීය.

ර. මු. ජ. රත්නායක,
ම. ප. පිස්කල් වෙනුවට.

2–85

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට 1 දක්වාද වෙනත් දිනවල පෙරවරු 9 සිට 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. පෝය දිනවලට පෙර දින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ට්ල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව | ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අහලට හෝ ඉන් කොටසකට | ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... ... | 220 | 0 |

අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30** ට සියළුම **දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | මෙරට | | පිටරට |
|---|---|---|---|---|
| | | රු. ශ. | | රු. ශ. |
| එක් කොටසක් | ... ... ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ජෙදයක් | ... ... | 17 50 | ... | 23 0 |
| I වැනි කොටසේ ජෙද දෙකක් | ... ... | 25 0 | ... | 33 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු එක කොටසක්... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ජෙදයක් ... ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ජෙදයක් ... ... | 0 30 | ... | 0 15 |

**දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි